EX/Rec/26/11

# නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයට අයත් ජනපද නිලධාරී III ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ජනපද නිලධාරී III ශ්‍රේණියට පවතින පුරප්පාඩු 13 සඳහා පළාත් කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් නැගෙනහිර පළාත් සභාවේ www.ep.gov.lk →Exams→Online Application ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026.09.14 වන දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2026.10.05 වන දින ප.ව. 10.00ට අවසන් වේ. මෙම ලිඛිත විභාගය ඉල්ලුම්පත්‍ර භාර ගැනීම අවසන් කළ පසු හැකිතාක් ආසන්න දිනෙක, මෙම නිවේදනයේ සඳහන් නැගෙනහිර පළාතේ නගර හතරකදී නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.

**2. බඳවා ගැනීම සඳහා වන කොන්දේසි :-**

i. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

ii. මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය. එමෙන්ම නැගෙනහිර පළාතේ අවුරුදු දහයක (10) අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුවේ.

iii. මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. ජනපද නිලධාරී III ශ්‍රේණියට බඳවා ගෙන වසර (03) ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

iv. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව පත්වීමේ දිනයේ සිට වසර 03ක් අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

v. ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති දැනටමත් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්ත වූවන් ඔවුනගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේම අයදුම්කරු මෙම තනතුර සඳහා තේරී පත්වුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා එකඟතාවය පළ කළ යුතුය. මෙම තනතුර සඳහා නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය නොමැතිව අයදුම්පත් යොමු කළ අයදුම්කරුවෙකු තෝරා ගත හොත් නව පත්වීමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**03. පොදු සුදුසුකම් ඃ-**

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිඳු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

iv. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වන එක් (01) අවුරුද්දක් තුළ අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචි වී සිටීම.

හෝ

අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වන අවුරුදු තුන (03) තුළ අඛණ්ඩව නැගෙනහිර පළාතෙහි පදිංචිව සිටින අයෙකු සමඟ ආවාහ/විවාහ වී වෙනත් පළාතක සිට මෙම පළාතට පැමිණ ඒ බව සනාථ කළ හැකි ලේඛණ ඉදිරිපත් කළ හැකි අයෙකු වීම.

v. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර මෙම නිවේදනයේ සඳහන් තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා තිබිය යුතුය.

**04. වයස් සීමාව ඃ-**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

**05. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් ඃ-**

**5.1 අධ්‍යාපන සුදුසුකම්**

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, කෘෂිකර්මය යන විෂයයන්ගෙන්, විෂයයන් දෙකක් (02) සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් ( පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබිය යුතුය.

**5.2 වෘත්තීය සුදුසුකම්**

(අ) කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොල, වවුනියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු (02) ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ආ) හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ඇ) රජය විසින් අනුමත ආයතනයක් මඟින් පිරිනමනු ලබන දෑ අවුරුදු (02) කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

(ඈ) ඉහත සඳහන් සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම් ලබා තිබීම.

**06. වැටුප ඃ-**

මෙම තනතුරට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 10/2025 අනුව **MN 3 - 2025** දරණ වැටුප් බණ්ඩය යටතේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ තනතුර සඳහා රු. **52,250-10x800-11x1,190-10x1,320-10x1,350- 100,040/-** වැටුප් පරිමාණයක් හිමි වේ. පත්වීමක් සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවෙකුට එම වැටුප හිමිවන්නේ 2027.01.01 දින සිට වන අතර පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවීම් සිදුකරනු ලැබේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමය ඃ-**

i. මෙම තනතුර සඳහා නැගෙනහිර පළාත් සභාව තුළ අනුමත අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයට අයත් ජනපද නිලධාරී බඳවා ගැනීමේ පරිපාටියටද, රජයේ පොදු පරිපාලන චක්‍රලේඛ, ජාතික හා පළාත් ප්‍රතිපත්ති සහ ලිඛිත තරග විභාගයේදී ලබාගන්නා ලකුණුවල එකතුවේ පළාත් කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කොට, පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.එහිදී මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව සම්මුඛ පරීක්ෂණයේදී හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදුකරනු නොලැබේ.

ii. ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ වැඩිම මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ.

iii. තෝරා ගන්නා අයදුම්කරුවන්ගෙන් විශේෂ අවශ්‍යතා සහිත වූවන් (ආබාධ සහිත පුද්ගලයින්) සඳහා වෙන් වූ ප්‍රතිශතය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන ප්‍රකාරව සලකා බලනු ලැබේ. අපේක්ෂකයෙකු පත්වීමක් සඳහා තෝරා ගැනීමේ දි අදාළ තනතුරේ රාජකාරි ඉටුකිරීමට තම ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුය.

**සටහන** - මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අදාළ පරිදි තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර ආබාධිත නොවන අයෙකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතුය

**08. විභාග ගාස්තු ඃ-**

විභාග ගාස්තුව රු.1000/- කි. මෙම මුදල අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට හෝ ඊදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත නමට නැගෙනහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත මාර්ගගත (online)ක්‍රමයට අයදුම්පත් යොමු කිරීමේදී අදාළ ස්ථානයෙහි උඩුගත (upload) කළ යුතුය. ලදුපතෙහි මුල් පිටපත අයදුම්පතෙහි බාගත කරගන්නා ලද දෘඩ පිටපත සමග එවිය යුතුය. කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මෙම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමටද ඉඩ දෙනු නොලැබේ. **එසේම මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.**

**09. විභාග කොන්දේසි ඃ-**

i. මාර්ගගත (online) විභාග අයදුම්පත **ඉංග්‍රීසි භාෂාවෙන්** සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත (online) අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති මෙම විභාග දැන්වීම බාගත කර, කියවා මෙහි සඳහන් උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගන්නා ලද බව/ භාරනොගන්නා බව අයදුම්කරු විසින් එවනු ලබන අයදුම්පතේ මුද්‍රිත පිටපත පරීක්ෂා කිරීමෙන් අනතුරුව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail) හෝ දැනුම් දෙනු ලැබේ.

ii. මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඉහත සඳහන් කර ඇති විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් මාර්ගගතව (online) නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

iii. විභාගය පැවැත්වීමට ආසන්න දිනෙක අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර සම්බන්ධව නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඒ බව සඳහන් කරමින් නිවේදනයක් අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් (SMS) මගින් සහ විද්‍යුත් තැපැල් ලිපිනයට (E-mail) දැනුවත් කරනු ලැබේ. ප්‍රවේශ පත්‍රය බලා සංශෝධන වෙතොත් **026 2228368** දරණ දුරකථන අංකයට අමතා අයදුම්පතට අනුව අදාල සංශෝදන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේ දි සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

iv. තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවෙකු වේ නම්, ඉහත දුරකථන අංකයට අමතා තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්පත් අංකය, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

v. අයදුම්පත ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරා ගත යුතුය.

vi. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, නියමිත සුදුසුකම් සපුරා නොගෙන මෙම විභාගයට ඉදිරිපත් වීම වරදක් සේ සලකනු ලැබේ.

**10. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

i. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු, එය බාගත (Download) කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර ලදුපතෙහි මුල් පිටපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැලවෙන සේ අලවා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර හෝ අවසන් දින ඉක්ම වී සතියකට පෙර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත, කන්නියා පාර, වරෝදය නගර්, ත්‍රිකුණාමලය** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලදුපතෙහි මුල් පිටපත අලවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම සුදුසුය.)

ii. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **EX/Rec/26/11 , "නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ ජනපද නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026"** ලෙස සඳහන් කළ යුතුය.

**11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ සැපයිය යුතු තොරතුරක් හිතාමතා සැපයීම පැහැර හැර ඇති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට හෝ ඔහුට/ඇයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පිළිවන.

**12. අත්සන සහතික කිරීම ඃ-**

අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, තම කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු රු. 854,880.00 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික එකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරියකු, බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තනතුරක් දරණ අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. **නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්** අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර එවිය යුතුය.

**13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව ඃ-**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය නොකර සහ විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳ නොමැති බව තහවුරු කර ගැනීම සඳහා මුහුණු දෙකන් නිරාවරණය වන සේ විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන්ට විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. එමෙන්ම විභාග ශාලාව තුළට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වනතුරු විභාග ශාලාධිපතිට හඳුනාගත හැකිවන පරිදි මුහුණු සහ දෙකන් ආවරණය නොකර සිටිය යුතුය.

14. **විභාගයට පෙනී සිටීම ඃ-**

i. ප්‍රවේශ පත්‍රයක් ලද විභාග අපේක්ෂකයකු තම ප්‍රවේශ පත්‍රයෙහි සඳහන් විභාග මධ්‍යස්ථානයේදී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය.

ii. සෑම විභාග අපේක්ෂකයකුම මාර්ගගතව (Online) යොමු කරන විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත සිටින සේ මුද්‍රණය කර මෙම දැන්වීමේ **12** හි සඳහන් පරිදි ප්‍රවේශ පත්‍රයෙහි අත්සන සහතික කරවාගත යුතුය. අත්සන සහතික කරගැනීමකින් තොරව විභාගයට පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර දෙනු නොලැබේ.

iii. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට අපේක්ෂකයාට සිදුවනු ඇත.

15. **විභාග පරිපාටිය ඃ-**

මෙම ලිඛිත පරීක්ෂණය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**ලිඛිත විභාගය ඃ-**

| **ප්‍රශ්ණ පත්‍රය** | **මුළු ලකුණු** | **කාලය** | **සමත් ලකුණු** |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | පැය 01 යි | 40 % |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | පැය 02 යි | 40 % |

**බුද්ධි පරීක්ෂණය ඃ-** මෙම ප්‍රශ්න පත්‍රය, අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය, විනිශ්චය කිරීම සඳහා සකස් කරනු ලබයි.

**විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය ඃ-**
මෙම ප්‍රශ්න පත්‍රය, පහත සඳහන් ප්‍රධාන පනත් යටතේ ව්‍යුහගත රචනාමය ප්‍රශ්න සහ සිද්ධි අධ්‍යයන ප්‍රශ්න වලින් සමන්විත වේ.

- 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනත (1996 දක්වා සංශෝධන සහිතව - කොටස 1-76)
- 1979 අංක 07 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීම) පනත
- 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත
- 1947 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනත (1994 දක්වා සංශෝධන සහිතව)
- 1907 අංක 16 දරණ කැලෑ ආඥා පනත (2009 දක්වා සංශෝධන සහිතව)
- 1980 අංක 47 දරණ මධ්‍යම පරිසර අධිකාරි පනත (2000 දක්වා සංශෝධන සහිතව)

**සටහන** ඃ- මෙම විභාගයෙන් සුදුසුකම් ලැබීමට නම් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) ලබාගත යුතුවේ.

16. විභාගය පැවැත්වීම සඳහා යෝජිත **ප්‍රධාන නගර හා එහි අංකයන්** පහත සඳහන් වේ.

| **නගරය** | **නගර අංකය** |
|---|---|
| ත්‍රිකුණාමලය | 01 |
| මඩකලපුව | 02 |
| අම්පාර | 03 |
| කල්මුණේ | 04 |

සැ.යු. **යම් නගරයකට ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන ප්‍රමාණවත් නොවේ නම් අයදුම්පතෙහි සඳහන් නගරයට යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.**

17. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් සඳහා වෙනත් දිනයකදී සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

18. තම සුදුසුකම් සනාථ කිරීමට අදාළ සියලු ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.

19. මෙම නිවේදනයෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම විභාගය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත පත්කිරීම් බලධාරියා සතු වේ.

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.
14.09.2026